"මේ මනුස්සයා ඇඹලයා වාගෙ අතෙන්ට එකතු වුණානෙ......" පන්හිඳ තමුන් ළඟ වාඩිවෙලා උන්නු පින්සලට කිව්වේ ඒ පේළියෙම වෙනත් තැනක හිටපු තවත් යාළුවෙකුගේ වයින් බෝතලයකට වහ වැටිලා උන්නු පැන්සලට දොස් මුරයක් දාන්න හිතාගෙන.

අපේ තුන්දෙනාම මේ උන්නේ ස්කැට්ස් ීක්ෂී* සංවිධානයෙන් ලෑස්ති කරපු "රස කළස"ට ගිහිල්ලයි. අන්තිම ආසන පේළියෙයි තුන්දෙනාම වාඩි වුණේ. ඒත් තමුන් ඉන්න පුටුව යට වයින් බෝතලයක් තියාගෙන රස විඳින යාළුවෙක් දැකලා පැන් එතෙන්ට හේත්තු වුණා.

"කොහොම හරි ඔය බෝතලේ හංගමු !" පන්, තමුන් ළඟ වාඩිවෙලා උන්නු පින්ට කිව්වා. "රස කළසේ" අනික් අයත් එක්ක අප්පුඩි ගහමින් සින්දු කියන අතරේ දෙන්නා එක්ක මාන බැළුවේ ඔය වැඩේට. හිටපු ගමන් පැන් ගාව උන්නු " වයින් මිත්‍රයා" මොනවා හරි දේකට ටිකකට නැගිටලා ගියා.

"ඔන්න වෙලාව....! පින්, පන්ට කිව්වා. ඔය වෙන-කොට "රස කළසේ", රස කතා කියන වෙලාවක් ඇවිල්ලයි තිබුණේ. පන් පැන් ඉන්න තැනට ගිහින් මොනවදෝ කනට කරල කිව්වා. පැන් නැගිටලා ඉස්සරහට ගියේ සංවිධායක මහත්තයෙකුට මොනවා හරි පන් කියපු දේ කියන්න වෙන්න ඇති. පැන්ව පිටත් කරපු පන් පුටුව යට තිබුණ වයින් බෝතලෙත් අරගෙනමයි ආවෙ. දැන් බෝතලේ පන්ගේ පුටුව යට !

"පින්සල මහත්තයාටත් රස කතාවක් තියෙනවලු කියන්න. අපි ඒ මහත්තයාටත් ආරාධනා කරනවා ඒ රස කතාවත් අපට කියන්න කියලා" මහික්‍රබෝනයෙන් සෑම් වීරරත්න මහත්තයා කියනකොටයි පින්සලට තේරුනේ පන්හිඳ පැන්සලව යැව්වෙ මේකටයි කියලා.

"මොන රස කතා ද ? මං ලෑස්තිවෙලත් නෙවෙයි ආවේ....." පින් පන්ට දෝස මුරයක් දැම්මා.

"එහෙම කියලා පුළුවනෑ....? දැන් ඉතින් මොනව



**සිසිර දිසානායක**

හරි ගිහින් කියන්න වෙයි !" පන් හිනාවුණා. පින් නැගිටල ගිහින් මයික්‍රපෝනය අතට ගත්තා.

"නෝනා වරුනි, මහත්වරුනි, මට රස කතාවක් කියන්න තිබුනේ නෑ. මට මෙතෙන්ට එන්න වුනේ වෙන කාරණයක් හන්දා. ඒත් මට මෙතෙන්ට එන අතරේ කතාවක් මතක් වුණා. ඒක කියන්නම්....

පහුගිය ඉරිදා දවසක උදේ පාන්දර 3''' රේඩියෝ එකේ සිංහල වැඩසටහන අපේ ගෙදර දාලා තිබුණා. එදා උදේ දහයට සිත්තම් වැඩමුළුවක් නගරයේ අනික් කොනේ තැනක තියෙනවා කියලා සමාජ නිවේදනවලට කියනවා හීනෙං වගේ මට ඇහුණා. චිත්‍ර ගැන පොඩි උනන්දුවකුත් තියෙන එකේ, ඔහොම දෙයක් දැකලත් නැති එකේ කො-හොම හරි ගිහින් බැළුවොත් හොඳ කියලා හිතුණා. ඉතින් දනි පනි ගාලා නැගිටලා ලෑස්තිවෙලා පැයක් විතර වාහනේ පදවගෙන එතෙන්ට ගියා."

"ඔයා මොකක් ගැනද මේ කතා කරන්නෙ" කියලා වැඩමුළුව සංවිධානය කරල තිබුණ සංවිධානයේ සභාපති තුමා අහනකොටයි මට තේරුණේ වෙච්ච පටලැවිල්ල."

ෂමාජ නිවේදනවලට කියලා තියෙන්නෙ "සිත්තම්" වැඩමුළුවක් ගැන නෙවේ. "අත්කම්" වැඩමුළුවක් ගැන. මට නිදිමරගාතේ "අත්කම්" කියන එක ඇහිලා තියෙන්නේ "සිත්තම්" වාගේ. නෝනා මහත්තුරු දෙන්නෙක් මැහුම්, ගෙතුම්, සැරසිලි කරන හැටි මේ වැඩමුළුවේ පෙන්නුවා. මාත් ඉතින් දුරුකතර ගෙවාගෙන නගරයේ එහා කොනට ගිය එකේ ඒවා බල බලා ඉඳලා ගෙදර ආවා...." පින් තමුන්ගේ රස කතාව ඉවර කළා.

ඒත් කාටවත් ඒකට හිනා ගියේ නෑ. හැමෝම පින් දිහා වෙච්ච වැඩේට අනුකම්පාවෙන් වගේ බලාගෙන උන්නා. පින්ටත් තමුන් ගැන තමුන්ටම දුක හිතුණා. ඒ එදා එතන වෙච්ච දේට නෙවි. මෙදා මෙතන වෙච්ච දේට.

"මදෑ වයින් බෝතලයක් හන්ද වෙච්ච දේ....." පින් තමුන්ටම කියාගත්තා. ඒත් මයික්‍රපෝනය ඒ වෙනකොටත් පින් අතේ තිබුණ හන්දා හැමෝටම ඒ කතාව අහුණා. ඒ කතාවට නම් හැමෝටම හිනා ගියා.




ස්කැට්ස් සංවිධානයට අවුරුදු විස්සක් පිරෙන හන්දා පවත්වන එක එක අංගවල එකක් විදියට "රස කළස" මේ වාරෙ සංවිධානය කළේ රෝහණ කරුණාරත්න, උපා උපදාස මහත්වරු. හැමෝම එකතු වෙලා සින්දු කියන්න වෙනදා වගේම සින්දු පොත් හදලා බලන්න ආව අය අතරේ බෙදලා දීලා තිබුණා. ඒ අතරේ ඉස්සරහ තිරේක වචන ලොකුවට පෙනෙන්න දැම්මා. පොත් නැති අය තිරේ බලාගෙනයි සින්දු කිව්වෙ. ලොකු මහත්තයා වාඩි වෙලා සින්දු කිව්වනං..... අපිට තිරේ පේන්නෑ.... "සින්දුවලට කුල්මත්වෙලා හිටගෙන පොඩි නැටුමකුත් කර කර අත්පුඩි ගහපු මහත්තයෙකුට පිටිපස්සේ පේළියක උන්නු කවුදෝ කෑ ගැහුවා." අපේ තුන්දෙනානම් නෙවෙයි.

# පුංචි පුංචි දේ

ජය ශ්‍රී චන්ද්‍රජිත් මහත්තයා හොඳ නූර්ති ගී දෙකතුනක් ගායනා කළා. මයික්‍රපෝනයත් නැතුව වේදිකාවක කියන විදියටම ගැඹුරු හඬින් කියපු ඒවා. හැමෝම අගය කළා. මේ සින්දුවලට සජීවීව සර්පිනාව වාදනය කළේ නාලක වීරකෝන මහත්තයා. තබ්ලාව වාදනය කළේ රෝහිත උඩවෙල මහත්තයා. ගිටාරයෙ-න් ශිල්ප පෙන්නුවෙ අසංග ලියනගේ තරුණ මිත්‍රයා. ජය ශ්‍රී මහත්තයා උණුසුම් හෘදයාංගම විදියට හඳුන්නලා දුන්න අතුල ලෙව්කේබණ්ඩාර මහත්තයා කියපු සින්දුවලටත් ලොකු ඉල්ලුමක් තිබුණා. ලංකාවේදීත් ගායන ශිල්පියෙක් විදියට දසකම් පෙන්න-පු, කාගෙත් හිත දිනාගත්ත කෙනෙකුට මෙල්බර්න් නගරයේ ඉන්න ලෙව්කේබණ්ඩාර මහත්තයා විතරයි මයෙ හිතේ....

ස්වර්ණා උපදාස නෝනමහත්තයා සංවිධානය කරපු "සෙලිබේටි හෙඩස්" (Celeberaty Heads) අංගයත් කාගෙත් හිත් ගත්තා. ඉදිරිපත් වෙන කෙනාගේ හිසේ ප්‍රසිද්ධ කෙනෙක්ගෙ නමක් ලියපු හිස් පළඳනාවක් පළඳවනවා ඒ එක්කෙනාට නොපෙ-නෙන්න. අනික් අයට ඒ නම පෙනෙනවා පළඳනාව දාගත්තම. ඉතින් අර පුද්ගලයා ප්‍රශ්ණ අහලා අනුමාන කරනවා කාගේ නමද තමුන්ගේ හිස් පළඳනාවේ තියෙන්නෙ කියලා.

"තමන් කවුද කියලා තමන් නෙදන්න අයට හොඳ තරඟයක්"පන්ට කියවුණා

බයිලා ගීතවල ආරම්භය, විකාශය හා හැඩරුව ගැන ශ්‍රීනාත් මද්දුමගේ මහත්තයා කරපු දේශනයේ බොහොම වැදගත් දේ තිබුණා. හය කොණ, අට කොණ වාද බයිලා, ගැන තමන් හොයාගත්ත කරුණු එක්ක මේ දේශනය මද්දුමගේ මහත්තයා ඉදිරිපත් කළේ ඒ ඒ බයිලා වර්ග ගායනා කරලා පෙන්නන ගමන්. හැමෝටම ඕවා ගායනා කරලා නිදර්ශන පෙන්නන්න බෑනේ. ඒ නිසා ඒ දේශනයක් ඊට පස්සේ ඉදිරිපත් කරපු බයිලා ගායනාත් හැමෝගෙම හිත් ගත්තා. ඒ බයිලා ගායනා කරපු අය ඒ විදියට අය ඒ විදියට ඇඳගෙන ඇවිත් රඟපාලා හිටපු හන්දා.

"ශ්‍රීනාත් ට මේ දේශනය මීට වඩා අවධානය ගන්න පුළුවන් තැනක ඉදිරිපත් කරන්න කියලා කියන්න ඕන කියලා ආප්ප පෝලිමේ තමුන් ළඟින් උන්නු මහින්ද දිසානායක දිවුල්ගනේ මහත්තයාට පන් කිව්වා. හුඟදෙනෙක් ඒ වෙලාවේ හිටියේ දේශප්‍රිය පුච්චලා දුන්න ආප්පවල උණුහුමේ.

"අපි උන්නෙ ගිය ඉරිදා උදෑනැක්කෙම තමුන්නැහේ ගෙදර වැඩවලින් බේරෙන්න අපට 'වංගුව' දාලා ගියා ය කියලා...." " රස කළස" ඉවර වෙලා ගෙදර එනිං ගමන් පන් පින්ට කිව්වා. " ඇත්තටම වචන පැටලිලා ද ගියේ ?" පන් ඇහුවා.

"ඒකනේ මං කිව්වේ. හැබැයි ඉතින් අත්කම් ප්‍රදර්ශනෙත් වටිනා වැඩක්. "නෝර්ත් මෙල්බර්න් ශ්‍රී ලංකා අසෝසේෂන්" :හදරඑය ඒැකඉදමරබැ ීරස ඕබන් ීදජස්එසදබ* එකෙන් තමයි ඒක සංවිධානය කරලා තිබුණේ. සිංහලෙන් කිව්වොත් උතුරු මෙල්බර්න් ශ්‍රී ලංකා සංගමය සංවිධානය කරපු මාසික හමුවේ අංගයක් ඒක. වැඩමුළුව කරගෙන ගියේ ස්වර්ණා ගුණසේකර, ශීලා ගුණසේකර නෝනා මහත්තුරු දෙන්නා.

එක එක විදිහෙ රටාවලට කතිර මැස්ම වගේ ක්‍රමවලට කරන නිර්මාණ පහළොස් වර්ගයක් විතර ස්වර්න නෝනා ඉදිරිපත් කළා. හරිම ඉවසීමෙන් පිළිවෙලකට කරගෙන යන්න ඕන වැඩක් ඒක. ඒ වගේම හොඳ කලාවක්. ශීලා නෝනා පෙන්නලා දුන්නේ එක එක සැරසිලි කරන විදිය. උත්සව සරසන්න කියාපු සැරසිලි. මේ දෙන්නාම ඒ සංගමයේ කමිටුවේ ඉන්න අය."

මේ මාසික හමුව පටන් ගන්නෙ ලංකාවයි, මෙහෙයි ජාතික ගීත ගායනා කරලා. සංගීතය මෙහෙයවන්නේ සංවිධානයේ සභාපති දයා සිල්වා මහත්තයා. ලේකම් තමයි අජිත් ද සිල්වා මහත්තයා. භාණ්ඩාගාරික හිමාලි කරුණාසේන නෝනා.



ජාතික ගීයෙන් පස්සෙ ශාරීරික ව්‍යායාම කරනවා. ඒක මෙහෙයවන්නේ ශාන්ති පොඩිමහත්තයා නෝනා මහත්තයා. වැඩමුළුවෙන් පස්සේ කෑම කන අතරේදී ලක්ෂානි පෙරේරා දුව ගීත ගායනා කළේ එයාගේ තාත්තාගේ ලක්මාල් පෙරේරා මහත්තයාගේ සංගීත වාදනයට. සුපුන් ලොකුලියන දුවත් මේ වාගේ ඉදිරිපත්වෙලා සින්දු කියන බව අහන්න ලැබුණා. සුපුන් වාගේ ම ලක්ෂානි දුවත් සිංහල නියම විදියට උච්චාරනය කරලා ළයාන්විත විදියට ගායනා කළා. වැඩිහිටියන්ගේ දේවල් වෙනුවෙන් කාලය කැප කරලා තමන්ගේ හපන්කම්වලින් දායකත්වය දෙන මේ වාගේ දරුවන් අපි අගය කරන්න ඕන...." පින් ඒ විස්තරේ ඉවර කළේ තුන්දෙනා එක්ක ආව වාහනේ ගෙදරට ළඟටම ආව නිසා.

"අපි මේ වාගේ පුංචි සුන්දර දේවල් ගැන කතා කරන්නෙ හරිම කැමැත්තෙන්. ඒ පුංචි දේවල් තමයි එකතු වෙලා ලොකු දේවල් විදියට එළියට එන්නෙ. හරියට පුංචි කඳුරු එක්කවෙලා ඇලවල් ඔයවල් හැදිලා ගංගාවක් වගේ මෝය කටින් එළියට එනවා වාගේ." පන් ගෙට ආව ගමන් පසු වදනක් ලිව්වා. ■

